# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,809 - 2013 මැයි මස 03 වැනි සිකුරාදා - 2013.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )



| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1120 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1129 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |



*සැ. යු.* - (i) වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මුදල් පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මැයි මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මැයි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## මදුරාවල ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

මදුරාවල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු ව පවතින උපලේඛනයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් හා දැනටමත් මදුරාවල ප්‍රාදේශීය සභාවේ සේවයෙහි නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු ගණන | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ III පන්තිය කාර්යාල කාර්ය සහායක | 02 | (PL-1-2006 A) රු.11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600 (ආරම්භක පියවර) | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06ක් සමත්වී තිබීම. |
| 02. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කාර්යාල සේවක සේවයේ III පන්තිය වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | PL-1-2006 A රු.11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600 (ආරම්භක පියවර) | අවම වශයෙන් 08 ශ්‍රේණිය/ 09 වසර යටත්ව සිටිය යුතු ය. |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

01. අයැදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
02. අයැදුම්කරුවන් බස්නාහිර පළාත තුළ අයැදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය,
03. අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය,
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බල නොපානු ඇත.)
04. අයැදුම්කරු මනා චරිතයකින් හා යහපත් ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

01. සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
02. බඳවා ගනු ලබන සේවකයන් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.
03. බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
04. මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා මුදල් රෙගුලාසිවලට ද ගරු ආණ්ඩුකාර තුමාගේ නියෝගවලටද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන වෙනත් නියෝගවලටද, පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට සියළුම සේවකයින් බැඳී සිටී.
05. අයැදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය මදුරාවල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :-*

01. මෙම නිවේදනයේ සඳහන් ආකෘතිය පරිදි සකසන ලද අයැදුම්පත් 2013.05.20 වැනි දිනට පෙර "ලේකම් මදුරාවල ප්‍රාදේශීය සභාව, මදුරාවල අඟුරුවාතොට" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු ය.

02. අයදුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරෙහි නම සඳහන් කළ යුතුය.

03. දැනටමත් රාජ්‍ය සේවයෙහි හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. අයැදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල ද සහතික පිටපත් එවිය යුතු ය :

(i) උප්පැන්න සහතිකය ,
(ii) අධ්‍යාපන සහතික,

(iii) පදිංචිය සනාථ කිරීමේ සහතික (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතු වේ.)
(vi) වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

සඳසීලී කාරියවසම්,
ලේකම්,
මදුරාවල ප්‍රාදේශීය සභාව,
මදුරාවල- අඟුරුවාතොට.

2013 මාර්තු මස 28 වැනි දින,
මදුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පතය*

*මදුරාවල ප්‍රාදේශීය සභාව*

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ........................................................ තනතුර සඳහා බඳවා ගැනීම .

1. *(අ)* මුලකුරු සමග නම :———————.
   *(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම්):———————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:———————.
3. ස්ථිර ලිපිනය:———————.
4. *(අ)* ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද ? :———————.
   *(ආ)* එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන්ද ? :———————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
6. ස්ත්‍රී/ පුරුෂ භාවය :————— .
7. විවාහක/අවිවාහක තත්ත්වය :—————.
8. දුරකථන අංකය :—————.
9. උපන් දිනය: වර්ෂය :—————. මාසය:—————. දිනය:—————.
10. 2013.05.20 වැනි දිනට වයස: අවුරුදු :—————. මාස:—————. දින:—————.
11. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :———————.
12. වෘත්තීය සුදුසුකම් :———————.
13. සේවා පළපුරුද්ද :———————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියේ වරදකරුවකු කරනු ලැබ තිබේද ? :———————.
15. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :———————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

———————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :———————.

දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා තම ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්කරු වන .................... මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කල හැක/නොහැක. ඔහු/ඇය මොන යම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයැදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

———————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :———————.
පදවි නාමය :———————.
දෙපාර්තමේන්තුව/ආයතනය (නිල මුද්‍රාව යොදන්න) :———————.
දිනය :———————.

05—42

## ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව

### මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | මාර්ග කම්කරු III වන පන්තිය | 03 | පී.එල්. 1-2006 ඒ රු.11,730- 10 x 120 - 10 x 130-10 145-12 x 160 - රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |
| 04. | සෞඛ්‍ය කම්කරු III වන පන්තිය | 01 | පී.එල්. 1-2006 ඒ රු. 12,470- 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 | අවම වශයෙන් 08 වන ශ්‍රේණියට (09 වන වසරට) නියමිත විෂය නිර්දේශය සම්පූර්ණ කර තිබිය යුතුය. |
| 05. | රියදුරු II ආ | 01 | පී. එල්. 3- 2006 ඒ රු. 12,470- 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 රු. 18,860 | *(අ)* අවම වශයෙන් 08 වන ශ්‍රේණියට (09 වන වසරට) නියමිත විෂය නිර්දේශය සම්පූර්ණ කර තිබිය යුතුය.<br>*(ආ)* පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.<br>*(ඇ)* රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසුව රියදුරකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතු අතර සහතික මගින් සනාථ කළ යුතුය.<br>*(ඈ)* අවම වශයෙන් උස අඩි 05 ක් විය යුතුය.<br>*(ඉ)* දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයක් තිබිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br>*(ඊ)* මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය. |
| 06. | විදුලි කාර්මික | 01 | පී. එල්. 2.-2006. ඒ රු.12,210 - 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු.18,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුය.<br>*(අ)* වෘත්තියට අදාලව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ2) හෝ 3 වන මට්ටමේ (NVQ3) සහතිකය ලබා තිබීම; හෝ<br>*(ආ)* කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම; හෝ<br>*(ඇ)* ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; හෝ<br>*(ඈ)* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; හෝ<br>*(ඉ)* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාලව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; හෝ<br>*(ඊ)* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. |

02. *බඳවා ගැනීම සඳහා වූ පොදු කොන්දේසි :-*

1. අයදුම්කරුවන් ශ්‍රීලංකාවේ පුරවැසියන් විය යුතුය.
2. අයදුම්කරුවන් ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අඛන්ඩව වසර 03 ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක නියුක්ත අයට උපරිම වයස් සීමාව අදාල නොවේ.)
4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරද කරුවන් කරනු ලැබූවකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.
6. දැනටමත් ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කෙරේ.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

1. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම කරනු ලැබේ.
2. රියදුරු තනතුර සඳහා බඳවා ගනු ලැබීමට පෙර අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට ද පෙනී සිටිය යුතු අතර, ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන්නා වූ අයදුම්කරුවන් පත් කිරීමට පෙර මෝටර් රථ වාහන අංශයේ නිලධාරියෙකු දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙක් හා පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුනත්වය මැනීමේ පරීක්ෂණයකින් ද සමත් විය යුතුය.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතයි.
2. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
3. බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් වේ.
4. ප්‍රමාණවත් ඇපයක් මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් ගෙවන ලෙසට නියම කළහොත් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතුය.
5. මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමා ගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පවරනු ලබන වෙනත් නියෝගවලට ද, පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියළුම සේවකයින් බැඳී සිටී.
6. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

05. *ඉල්ලුම්කළ යුතු ආකාරය :-*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් 2013.05.17 වැනි දිනට හෝ එදිනට පෙර "ලේකම්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව, කුරුදුවත්ත කඩ වීදිය" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත් බහාලන කවරයේ වම් පස කෙළවරේ "අයදුම් කරන තනතුර" පැහැදිළිව සඳහන් කළ යුතුවේ. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු ආයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුවේ.) අයදුම්පත් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*06. ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන :-*

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුනා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතු වේ.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් ගේ සහතිකය,
4. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතුය)
5. සේවා සහතිකය (දැනට රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි)

දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

ඩී. ඒ. රංජනී ප්‍රේමලතා,
ලේකම්,
ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව,
කුරුදුවත්ත කඩ වීදිය.

2013 අප්‍රේල් මස 11 වැනි දින,

ආදර්ශ අයදුම් පත්‍රය

**ගඟඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව**

*................................................... තනතුර සඳහා අයදුම් පතය*

1. (අ) මුලකුරු සමග නම :——————————.
   (ආ) සම්පූර්ණ නම :——————————.
2. ලිපිනය :——————————.
3. උපන් දිනය ෘ අවුරුද්ද:——————————. මාසය:——————————. දිනය :——————————.
   1. 2013.05.17 දිනට වයස :——————————.
4. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
5. විවාහක/අවිවාහක බව:——————————.
6. ජාතිය:——————————.
7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද?. එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග:——————————.
8. අධ්‍යාපන සුදුසුකම්:——————————.
9. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද:——————————.
10. රියදුරු තනතුර සඳහා වන්නේ නම්:——————————.
    (අ) රියදුරු බලපත්‍රයේ අංකය:——————————.
    (ආ) නිකුත් කළ දිනය:——————————.
11. ඔබ දැනටමත් මෙම ආයතනයේ සේවය කරන්නේ නම් තනතුර හා සේවා කාලය:——————————.
    (එම පත්වීමේ ස්වභාවය ෘ (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම් මත ද යන වග)

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

05-41

---

**මැදදුම්බර ප්‍රාදේශීය සභාව**

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 03 | පීඑල් 1 2006A රු. 11,730 -10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - රු. 17,600 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත්වී සිටිය යුතුය. |
| 02. | සෞඛ්‍ය කම්කරු | 01 | පීඑල් 1 2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - රු. 17,600 | එම |
| 03. | පුස්තකාල සේවක | 02 | පීඑල් 1 2006A රු. 11,730 -10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 -රු. 17,600 | අ.පො.ස. (සා. පෙ.). ජ. අ.පො. ස. (සා. පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6 කින් සාමාර්ථය ලබා තිබීම. |

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 04. | විදුලි කාර්මික | 01 | පීඑල් 2 2006A රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 | අ.පො.ස. (සා.පෙ.) ජ.අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6 කින් සාමාර්ථය ලබා තිබීම. පිළිගත් කාර්මික පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයේ එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම * අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. |

02. *බඳවා ගැනීමේ කොන්දේසි :*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
2. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 03 ක කාලයක් මැද දුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුතු අයදුම්කරුවන්ට වයස් සීමාව බලනොපානු ඇත.)
4. අයදුම්කරු මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
5. සුදුස්සන් තෝරා ගැනීම විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මත සිදු කරනු ලැබේ.
6. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු හෝ දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
7. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.
8. දැනට මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්ත අනියම්/ආදේශක/දීමනා මත හෝ සේවයේ යෙදී සිටින සේවකයින් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. ස්ථිර පත්වීම අවුරුදු 03 පරිවාස කාලයකට යටත්වේ.
3. මෙම බඳවාගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග රජය, හා මධ්‍යම පළාත් සභාව වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

04. *අයදුම්පත් එවිය යුතු ආකාරය :*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව, ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු අතර, අයඳුම්පත් "ලේකම්, මැදදුම්බර ප්‍රාදේශීය සභාව, තෙල්දෙනිය" යන ලිපිනයට 2013.05.23 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයඳුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

2. අයඳුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් ද එවිය යුතුය.

   (i) උප්පැන්න සහතිකය
   (ii) අධ්‍යාපන සහතිකය
   (iii) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික
   (iv) ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය
   (v) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිළධාරීගෙන් ලබා ගත් එකක් විය යුතුය.)

එම්. ආර්. ජී. හේරත් බණ්ඩා,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2013 අප්‍රේල් මස 17 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ............................................................. තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (අ) මුලකුරු සමග නම :——————————.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම්:——————————.
02. ස්ථිර ලිපිනය:——————————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
05. (අ) උපන් දිනය ඃ අවුරුද්ද:——————————. මාසය:——————————.දිනය:——————————.
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස ඃ අවුරුදු :——————————.මාස:——————————. දින.:——————————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
07. විවාහක/අවිවාහක බව:——————————.
08. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේනම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන් ද?:——————————.
09. අධ්‍යාපන සුදුසුකම්:——————————.
10. වෙනත් සුදුසුකම්:——————————.
11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඒ පිළිබඳ විස්තර ඃ-
(1) දැනට දරන තනතුර:——————————.
(2) ස්ථිර/අනියම්/ආදේශක/දීමනා මත ද යන වග:——————————.
(3) එම තනතුරට පත් වූ දිනය:——————————.
12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරද කරුවකු කරනු ලැබ තිබේද?:——————————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරැදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය:——————————.

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන...................................................... මහතා/මිය/මෙනෙවිය මෙම ආයතනයේ.................................................. තනතුරේ සේවයේ නියුක්තව සිටී. ඉහත තනතුර සඳහා තෝරාගත හොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයක දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
තනතුර:——————————.
නිල මුද්‍රාව:——————————.

05-43

---

## ගලේවෙල ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ ගලේවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ ඃ

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අධ්‍යාපනික සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | රියදුරු 11 (ආ) පන්තිය | 02 | PL-3-2006A<br>රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | (අ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් විෂයන් 06ක් සමත්වී තිබීම.<br>(ආ) පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අධ්‍යාපනික සුදුසුකම් හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | (ඇ) රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රියදුරු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතුයි.)<br>(ඈ) දිවා කාලයේදී හා රාත්‍රී කාලයේ සේවයේ යෙදීම පිණිස මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයක් තිබිය යුතු අතර මනා දෑස් පෙනීමක් තිබිය යුතුයි.<br>(ඉ) මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුයි.<br>(ඊ) අවම උස අඩි 05ක් විය යුතුයි. |
| 02. | විදුලි කාර්මික (111 පන්තිය) | 01 | PL-2-2006A<br>රු. 12,210- 10 x 130 - 10 x 145 - 10 x 160 12 x 170 - රු. 18,600 | (අ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් විෂයයන් 06ක් සමත්වී තිබීම.<br>(ආ) වෘත්තියට අදාළ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතු ය. |
| 03. | කාර්යාල කාර්ය සහයක (111 පන්තිය) | 01 | PL-1-2006A<br>රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු. 17,600 | (අ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් විෂයයන් 06කින් සමත්වීම. |
| 04. | පුස්තකාල සහයක/ පුස්තකාල උපස්ථායක (111 පන්තිය) (Library Attendent) | 01 | PL-1-2006A<br>රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු. 17,600 ආරම්භය රු. 13,060 (12 වන පියවර) | (අ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් විෂයයන් 06කින් සමත්වීම. |
| 05. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු (111 පන්තිය) | 01 | PL-1-2006A<br>රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු. 17,600 | (අ) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් ව තිබීම. |
| 06. | සෞඛ්‍ය කම්කරු (111 පන්තිය) | 03 | PL-1-2006A<br>රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු. 17,600 | (අ) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් ව තිබීම. |

02. *පොදු සුදුසුකම් :-*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය;
(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය;
(iii) තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාළ නොවේ);
(iv) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (ඡන්දහිමි නාමලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කළ සහතිකයකින් සනාථ විය යුතු ය.);
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය;
(vi) දැනටමත් ගලේවෙල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ;
(vii) අයදුම්කරුවන්/අයදුම්කාරියන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :—*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :—

01. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. නියමිත පරිදි වැන්දඹු අනන්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය;
02. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ;
03. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලට ද , පළාත් පාලන ආයතනවලට අදාළ ආඥාපනත් / පනත්වල විධිවිධානවලට ද, ගලේවෙල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය* :-

දැනටමත් රාජ්‍ය /පලාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල ගලේවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

මෙම නිවේදනය අවසානයේ සඳහන් ආදර්ශ ආකෘතිය ප්‍රකාරව අයදුම්පත්‍ර 2013 මැයි මස 15 වැනි දිනට හෝ ඊට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, ගලේවෙල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනු පිටපත් අමුණා එවිය යුතු ය.

01. උප්පැන්න සහතිකය;
02. අධ්‍යාපන සහතිකය;
03. හැඳුනුම්පතේ පිටපතක්;
04. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (ඉන් එක් චරිත සහතිකයක් ග්‍රාම නිලධාරි සහතිකය විය යුතු ය.)
05. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වන්නේ නම් සේවා සහතික.

එච්. නිමල් ගුණවර්ධන,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ගලේවෙල.

2013 අප්‍රේල් මස 03 වැනි දින,
ගලේවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

***මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගලේවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ................ තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————.
(ii) මුලකුරු සමග නම :——————.
02. ස්ථිර ලිපිනය :——————.
03. ග්‍රාම නිලධාරි වසම හා අංකය :——————.
04. උපන් දිනය : අවුරුද්ද:——————. මාසය:——————. දිනය:——————.
05. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු:——————. මාස:——————. දින:——————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
07. ජාතික හැඳුනුම්පත් අංකය:——————.
08. ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය වසර :——————.
09. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ උපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග :——————.
10. අධ්‍යාපන සුදුසුකම්:——————.
11. වෙනත් සුදුසුකම්:——————.
12. වෘත්තීය සුදුසුකම්:——————.
13. සේවා පළපුරුද්ද:——————.
(i) දැනට සේවය කරන ආයතනය :——————.
(ii) දැනට දරන තනතුර :——————.
(iii) එම තනතුරට පත්වූ දිනය :——————.
(iv)මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ෑ*

මෙම ඉල්ලුම්කරුවන ..................................................................මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් , ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ හෝ
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :————————.
පදවි නාමය :————————.
දෙපාර්තමේන්තුව/ආයතනය(නිල මුද්‍රාව තබන්න) :————————.
දිනය :————————.

05—84

---

# පළාත් පාලන නිවේදන

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම

1952 අංක 6 දරන (පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද 1988 අගෝස්තු මස 23 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 1988 අගෝස්තු මස 17 වන දින පළාත් පාලන නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් පළකරනලද අංක 01 සිට 42 දක්වා වූ (පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා) ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ 2012.08.30 දින මහ සභා රැස්වීමේදී පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කළබව මෙයින් නිවේදනය කරමි.

යූ. කේ. සුමිත් වීරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව.

2013 ජනවාරි මස 08 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

05—47/1

---

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම

1952 අංක 6 දරන (පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ කියවෙන 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2(1) (අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2003.11.28 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 2003 ඔක්තෝබර් මස 30 දින වයඹ පළාත් සභාවේ පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් පළකරන ලද නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම (සම්මත අතුරු ව්‍යවස්ථා) ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ 2012.02.28 දින මහ සභා රැස්වීමේදී පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

යූ. කේ. සුමිත් වීරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව.

2013 ජනවාරි මස 08 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

05—47/2

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම

**ඉබබාගමුව ප්‍රාදේශීය සභාව විසින් සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගනු ලැබූ බව ප්‍රකාශයට පත් කිරීම**

***1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනත)***

261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් 2012.11.29 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. සුමිත් වීරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව.

2013 ජනවාරි මස 07 වැනි දින,
ඉබ්බාගමුවේ දී,

*ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම සඳහා වන යෝජනාව*

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළකරනු ලැබූ වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.04.28 අංක 1703/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ද ප්‍රාදේශීය සභාවල අප්‍රසන්න අන්තරාදායක සහ අප්‍රසන්න අන්තරාදායක වෙළඳාම් කටයුතු, සංචාරක වෙළඳාම, ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීමට, ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම, ලැගුම් නිවාස සහ නවාතැන් පොළවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පලකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

යූ. කේ. සුමිත් වීරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව, ඉබ්බාගමුව.

05-47/3

---

**කුරුවිට ප්‍රාදේශීය සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනත (272 අධිකාරය)

2013 ජනවාරි 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළවූ, පහත උපලේඛනයේ සඳහන් ගෝඝාතකාගාර සඳහා බලපත්‍ර ලබා දීමට විරෝධතා කැඳවූව ද අදාල කාලසීමාව තුළ විරෝධතා කිසිවක් නොවූයෙන් අදාල ඉල්ලුම්කරුවන් වෙත එම බලපත්‍ර 2013 දෙසැම්බර් 31 දක්වා ලබා දෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රේමරත්න මල්කැකුළ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2013 අප්‍රේල් මස 11 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***උපලේඛනය***

| | *ඉල්ලුම්කරුවන්ගේ නම සහ ලිපිනය* | *ගෝඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* |
|---|---|---|
| 01. | ඒ. ඒ. එම්. නසාර් මයා<br>අංක 155, මලව, කුරුවිට | මංකඩහේන, මලව, කුරුවිට |
| 02. | එම්. එස්. එම්. ගවුස් මයා<br>තලාවිටියවත්ත, ඇහැලියගොඩ. | අංක 19, උඩහගම, තලාවිටියවත්ත,<br>ඇහැලියගොඩ. |

05-59

**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථාව

261 වන අධිකාරය වන අංක 1952 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (I) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2012.10.30 දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 05-5 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
රුවන්වැල්ල.

රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (I) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (I) වන උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සාදනු ලැබ 2011.01.28 දිනැති අංක 1691 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළකරන ලද, සබරගමුව පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බව 2012.03.30 දිනැති අංක 1752 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (IV) අ කොටසේ පළකරන ලද්දාවූ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභාවල මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (I) වන උපවගන්තිය යටතේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

05-46

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතුය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිළ** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිළදී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2013** | | | | | |
| මැයි | 2013.05.03 | සිකුරාදා | 2013.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.10 | සිකුරාදා | 2013.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.17 | සිකුරාදා | 2013.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.23 | බ්‍රහස්පතින්දා | 2013.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.31 | සිකුරාදා | 2013.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2013.06.07 | සිකුරාදා | 2013.05.23 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.06.14 | සිකුරාදා | 2013.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.06.21 | සිකුරාදා | 2013.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.06.28 | සිකුරාදා | 2013.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2013.07.05 | සිකුරාදා | 2013.06.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.12 | සිකුරාදා | 2013.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.19 | සිකුරාදා | 2013.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.26 | සිකුරාදා | 2013.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.